# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2482/12 - 2026 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2026.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන ම විසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2026 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. වරින් වර සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කල 2026 මාර්තු 26 දිනැති අංක 26/0597/817/017 දරන ඒකාබද්ධ සංදේශය පිළිබඳව වූ 2026 මාර්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි පනවනු ලැබේ.

4. 2025 අප්‍රේල් 29 දිනැති අංක 2434/12 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් සංශෝධනය කරන ලද 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල කෙසේ සඳහන් වුවද, සහල් තොගය නැව් ගතකළ දිනය 2026 අප්‍රේල් 02 සිට 2026 අප්‍රේල් 30 දක්වා වන කාලය තුළ බවට නෞභාර පත්‍රයේ සඳහන්ව ඇති, සම්බා සහ කීරි

1A - PG 7590 — 373 (2026/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සම්බා සඳහා පිළිවෙළින් ආදේශක සේ සළකනු ලබන සහ සංයෝජිත වර්ගීකරණ කේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති, පොන්නි සම්බා සහ කිරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 සහල් ලෙස හඳුන්වන සහල් වර්ගය ආනයනය කිරීම සඳහා ආනයන පාලන බලපත්‍රයේ අවශ්‍යතාවය මෙයින් නිදහස් කරනු ලැබේ.

කෙසේ වෙතත්, මෙම රෙගුලාසි යටතේ, එක් ආනයනකරුවෙකුට සම්බා සහ කීරි සම්බා සඳහා ආදේශක සේ සළකනු ලබන පොන්නි සම්බා සහ කිරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 සහල් උපරිම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,040ක් පමණක් නෞභාර පත්‍රයේ සඳහන්කර ඇති නැව් ගත කළ දිනය 2026 අප්‍රේල් 02 සහ 2026 අප්‍රේල් 30 අතර දිනයක් සහිතව ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

5. ඉහත රෙගුලාසි අංක 4 හි සඳහන් සහල් තොග 2026 මැයි 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගත යුතු ය.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත ‘‘මෙහෙයුම් උපදෙස්’’ නිකුත් කරනු ලැබිය යුතුය.

7. මෙම රෙගුලාසි 2026 අප්‍රේල් 02 දින සිට බලාත්මක වේ.

EOG 04 - 0042

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.